**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>හත් වන ආයුර්වේද දිනය සැමරේ</u>**

**7 වන ආයුර්වේද දිනය නිමිත්තෙන් කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් සංවිධානය කළ විශේෂ ප්‍රදර්ශනයක් 2022 ඔක්තෝබර් 22 වන දින පැවත්විණ. "සැමට දින ආයුර්වේදය, සැම තැන ආයුර්වේදය" යන තේමාව යටතේ පැවති මෙම ප්‍රදර්ශනයේ ප්‍රධාන අරමුණ වූයේ වඩා යහපත් සෞඛ්‍යයක් සහ ජීවිතයක් සඳහා ආයුර්වේදය පිළිබඳ දැනුම ලබා දීමයි.**

**2. ශ්‍රී ලංකාවේ වැඩ බලන ඉන්දීය මහ කොමසාරිස් ශ්‍රී විනෝද් කේ. ජේකබ් මහතා මෙම ප්‍රදර්ශනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී විය. ධනවන්තරි ජයන්තිය සහ දීපාවලි උත්සවය වෙනුවෙන් සුබ පැතුම් එක් කළ වැඩ බලන මහ කොමසාරිස්තුමා මිනිස් සිරුර සහ පරිසරය අතර මනා සුසංයෝගය දිරිමත් කරන සාකල්‍ය වෛද්‍ය ක්‍රමයක් ලෙස ආයුර්වේදයේ වැදගත්කම අවධාරණය කළේය.**

**3. ශ්‍රී ලංකා ජාතික පොලිස් ඇකඩමියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අතුල අමරසිංහ මහතා උත්සවයේ ගෞරවනීය අමුත්තා ලෙස සහභාගී විය. කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ වෛද්‍ය මහාචාර්ය පතිරගේ කමල් පෙරේරා විෂය ප්‍රාමාණිකයකු ලෙස මෙම අවස්ථාවට සහභාගී විය. ආයුර්වේදය තුළ ආහාර, ඔසු පැළ සහ කුළු බඩු සඳහා හිමි කාර්යභාරය පෙන්වාදුන් එතුමා ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු බටහිර වෛද්‍ය විද්‍යාව පුද්ගලයන් සඳහා සාකල්‍ය ජීවන විලාසිතාවක් ප්‍රවර්ධනය කිරීම උදෙසා ආයුර්වේදය පිළිබඳ ඉහළ උනන්දුවක් දක්වන බව සඳහන් කළේය. ආයුර්වේදය පිළිබඳ ප්‍රවීණයන් වන රුවි රොද්‍රිගු මහත්මිය සහ වෛද්‍ය අමිල වික්‍රමසිංහ මහතා ප්‍රදර්ශනයට එක් කර තිබූ විවිධ ප්‍රදර්ශන භාණ්ඩ විස්තර කළහ. ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් 50 දෙනෙකු පමණ මෙම ප්‍රදර්ශනයට සහභාගී වූහ.**

**4. වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඉපැරණි සංස්කෘතික ග්‍රන්ථයේ දැක්වෙන ආයුර්වේදයට අධිපති දෙවියන් වන ධනවන්තරි දෙවියන්ගේ ජන්ම දිනය නිමිත්තෙන් සෑම වසරකම ධනවන්තරි ජයන්තියේ දී ආයුර්වේද දිනය සමරනු ලැබේ.**

**ධනවන්තරි ජයන්තිය, ආලෝකයේ උත්සවය ලෙස සැලකෙන දීපාවලි සැමරුම සිදු කෙරෙන දවස් පහෙන් පළමු දිනය ද වේ.**

**5.** **ඉන්දියානු රජයේ ආයුර්වේද, යෝගා, ස්වභාවික වෛද්‍ය විද්‍යාව, යුනානි, සිද්ධ, සෝවා - රිග්පා සහ හෝමියෝපති (AYUSH) අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් දේශීය විකල්ප වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා පියවර රැසක් ගෙන ඇත. කොවිඩ් වසංගත කාලය අතරතුර අමාත්‍යාංශ ද්විත්වය විසින් යහපත් සෞඛ්‍ය සහ මනා සෞඛ්‍යාරක්ෂාව සහ කොරෝනා වෛරසයට මුහුණ දීම සඳහා ප්‍රතිශක්තිය වර්ධනය කිරීමට ඉවහල් වන මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලදී.**

********

**කොළඹ**
**2022 ඔක්තෝබර් 26**